ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT


චක්‍රලේඛ අංකය: PS/SP/SB/Circular/06/2019
2019 දෙසැම්බර් මස 19 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත**

**ආයෝජකයින්, ණය දෙන ආයතන, විදේශීය සංවිධාන සහ දූත මණ්ඩල සමඟ කටයුතු කිරීම පිණිස පවත්නා යාන්ත්‍රණය ප්‍රතිසංවිධානයෙන් කාර්යක්ෂම කරලීම**

රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා, රජයේ දෙපාර්තමේන්තු, නියාමන ආයතන, ප්‍රවර්ධන ආයතන, ව්‍යවස්ථාපිත නියෝජිත ආයතන, රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ආයෝජකයින්, ණය දෙන ආයතන, විදේශ සංවිධාන සහ දූත මණ්ඩල හා සම්බන්ධ වෙමින් විවිධ වූ මූල්‍යයන වැඩසටහන්, ණය ලබා ගැනීමේ විධිවිධාන, රේඛීය ණය සහ එබඳු වෙනත් සාධන පත්‍ර සහ අදාළ ආකෘතික රාමුව තුළ අපේක්ෂිත නිසි ක්‍රියාවලියෙන් ඔබ්බට පවා යමින් විවිධ අවබෝධතා ගිවිසුම් හා ගිවිසුම්වලට එළඹෙමින් කටයුතු කරනු ලබන බැව් නිරීක්ෂණය වී ඇත. විදේශ සම්බන්ධතාවනට අදාළ අමාත්‍යාංශ, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව දැනුවත් බවකින් හා උපදෙස් විමසුමකින් හා එකඟත්වයකින් තොරව මෙවැනි ගනුදෙනු බොහොමයක් සිදු කරනු ලබන බව ද සනිටුහන් වී ඇත. ඉහතදී එලෙසින් එළෙඹි බොහෝ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශවීය ගිවිසුම් මෙන්ම අවබෝධතා ගිවිසුම් වලට එළඹීම නිසි අවශ්‍යතා ඇගයීමකින් සහ ප්‍රමාණවත් පරිදි පූර්ව සූදානම් වීමකින් තොරව සිදු වීමෙන් දුර්වල ලෙස සකසා තිබීම නීතිමය බාධක ඇතුළු ක්‍රියාත්මක කිරීමේ බහුවිධ දුෂ්කරතාවනට මං පාදන්නක්ව ඇත. මෙය විශ්වාසය පළුදුවීම්, පාර්ශවයන් අතර සදොස් වැටහීම්, නීතිමය ආරවුල්, කීර්තිනාම හානි මෙන්ම සිදුව ඇතැයි කියනු ලබන අක්‍රමිකතාවනට පවා හේතු කාරක වී තිබේ.

තව ද, ව්‍යාපෘති කළමනාකරණයෙහි අධික ගනුදෙනු පිරිවැය කෙරෙහිද අවධානය යොමු කෙරී ඇති අතර, බහුවිධ උපදේශන සමාගම් මත අධි විශ්වාසය තැබීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස විශාල මුදලක් වැය කිරීමට සිදු වීම ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතා කරලීම වෙනුවට ණය දෙන්නන් හට විශේෂිත වූ ප්‍රසම්පාදන පිළිවෙත් අනුගමනය කිරීම, විශේෂයෙන් කුඩා ව්‍යාපෘතීන්ට අදාළව රජය සතු මිනිස් බල සම්පත් උපයෝජනය වෙනුවට වෙන් වශයෙන් ව්‍යාපෘති කාර්යාල පවත්වාගෙන යාම, පවතින සම්පත් භාවිතා කිරීම වෙනුවට ගොඩනැගිලි, වාහන සහ සැපයුම් සහය ලබාගැනීම යන කරුණු විචක්ෂණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට සහ වගවීම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

ව්‍යාපෘතියක් අයවැය චක්‍රයට ප්‍රවිෂ්ට වීමෙන් අනතුරුව ව්‍යාපෘති ඇතුළු යම් රජයේ වැය වැඩසටහනක් ඇරඹීම සහ පාර්ලිමේන්තුව විසින් අනුමත කෙරුණු පරිදි අයවැයෙන් වෙන් කෙරුණු මුදලින් වැය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සෙන්ම විගණන නිෂ්කාශනය ආදිය ද අවශ්‍ය බව ද සනිටුහන් කර ගත යුතුය.

මෙම පසුබිම තුළ, විශ්වසනීය රජයේ සේවා සැපයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ අරමුණින් ගුණාත්මක පාලනය අරබයා වූ කැපවීම ප්‍රකාර සුපැහැදිලිව ප්‍රකාශිත රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම පසුබිම තුළ මතු දැක්වෙන කරුණු ඇඩිව පිළිපදින මෙන් ඔබහට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. විශිෂ්ට ක්‍රියා පිළිවෙත්

1.1 වහාම බලපැවැත්වෙන පරිදි, කිසිඳු නව බැඳීම් වලට මෙන්ම විදේශ රජයයන් හා සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් හෝ ගිවිසුම්වලට එළඹීමෙන් වළකින්න. එබඳු පියවර ලැනීමට ක්‍රියා කිරීම විදේශ සම්බන්ධතා අමාත්‍යාංශයෙහි වගකීම බැව් සනිටුහන් කරගත මැනවි. කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙතොත්, එය විදේශ සම්බන්ධතා අමාත්‍යාංශය වෙත


ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

යෝජනාව ආයෝජන මණ්ඩලය වෙත යොමු කිරීමෙන් දින 45ක් ගත වීමට පෙර යෝජනාව පිළිගත හැකි ද නැද්ද යන වග අදාළ අනාගත ආයෝජකයා වෙත දන්වා සිටිය යුතුය. එහෙයින් එබඳු ඇගයීම් ක්‍රියාවලිය නිමාවට පත්ව අනාගත ආයෝජකයා වෙත තීරණයක් දැනුම් දෙනු ලබන තෙක් ආයෝජන මණ්ඩලය විසින් කිසිඳු ආයෝජකයෙකු ලියාපදිංචි නොකළ යුතුවාක් මෙන්ම ආයෝජන යෝජනා භාර දෙන්නා වූ සියලුම ආයෝජකයින් වෙතින් අය කෙරෙන නියමිත ඇගයීම් ගාස්තුව හැර කිසිඳු ගාස්තුවක් හෝ සේවා ගාස්තුවක් අය කිරීමක් නොකරනු ලැබිය යුතුය.

4. **මූල්‍ය යෝජනා** - සියලුම ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය ණය දෙන ආයතන, ව්‍යාපෘති මූල්‍යකරුවන් සහ ඔවුනගේ නියෝජිතයින්, ඔවුන්ගේ සියලු මූල්‍ය යෝජනා වලට කේන්ද්‍රීය ස්ථානය මහා භාණ්ඩාගාරය බව දැනුවත් කර එමගින් හොඳම මහ පෙන්වීම් ලබා දීම සහ එවැනි කරුණු සඳහා උපදෙස් දීම සඳහා "ඉදිරිපස කාර්යාල"ද පිහිටුවනු ඇත. ඕනෑම අමාත්‍යාංශයක හෝ ආයතනයක විෂය පථයට අදාළ සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපෘති සකස් කිරීම, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මහ පෙන්වීම යටතේ සිදු කළ යුතුය.

5. **විදේශ මූල්‍ය සම්පත්** - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වූකලී සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ මුදල් ලබා ගැනීම භාරව ක්‍රියා කරන රජයේ ඉහළම තළයේ ඒකකය වෙයි. විදේශ සම්පත් දෙපාර්තමේනතුව විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශ පාදක කොට ගනිමින් සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර අදාළ ක්‍රියාකාරකම්හි නිරත වනු ඇත. එබැවින් සෙසු රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන, බාහිර ප්‍රභවයන් වෙතින් සෘජුව මූල්‍ය සම්පත් සෙවීමෙන් වැළකී සිටිය යුතුය.

6. **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියරේදී ණය දෙන ආයතන හා සම්බන්ධීකරණය** - භාණ්ඩාගාරය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හරහා අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරලමින්, සියලු ද්විපාර්ශවීය සහ බහුපාර්ශවීය ණය දෙන ආයතන, ව්‍යාපෘති මූල්‍යකරුවන් සහ ඔවුන්ගේ නියෝජිතයන් සමඟ සම්බන්ධ වී ව්‍යාපෘති සැකසීමේ අදියරේදී සියලුම ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳව සම්බන්ධීකරණය කරනු ඇති අතර එමගින් ණය දෙන ආයතනයනවල දූත මණ්ඩලයන්හි සංචාරයන් අවම කරගත හැකි වනු ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියරේදී අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු කාර්ය සාධන සමාලෝචන මෙහෙයුම් මෙයට ඇතුළත් නොවේ.

7. **ප්‍රගති සමාලෝචනය සහ පසු විපරම** - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ පසු විපරම් කටයුතු අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීම වන්නේය. මෙහෙයුම් ගැටළු විසඳාලීමේ අරමුණින් අදාළ රාජ්‍ය ලේකම්වරයාගේ සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මාසිකව සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුය. නොවිසඳුණු ඕනෑම ප්‍රශ්නයක් ලැයිස්තුගත කර ඊළඟට පැවැත්වීමට නියමිත මාසික ලේකම්වරුන්ගේ රැස්වීමේදී සලකා බැලිය යුතුය. තත් කාර්යය සඳහා සියලු ලේකම්වරුන් සහභාගී වනු ඇති අතර එමගින් විසඳුමක් ලැබෙනු ඇත.

8. **මෙහෙයුම් රැස්වීම්** - අර්ථාන්විත සහ සඵල රාජ්‍ය වියදම් කළමනාකරණයක් අරඹයා සම්බද්ධ ප්‍රයත්නයන් දැරීම සහතික කරගනු පිණිස ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය මූල්‍යයන ආයතනයන් විසින් සහය දක්වනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන් පිළිබඳව අවශ්‍ය වන විටදී මෙහෙයුම් රැස්වීම් පැවැත්විය යුතුය.

9. **පවත්නා වැඩ සටහන් තව දුරටත් කරගෙන යාම** - රේඛීය අමාත්‍යාංශ මට්ටමින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී නිමාවට ළඟාවෙමින් ඇති යම් ව්‍යාපෘතියක් හෝ වැඩ සටහනක් තව දුරටත් ඉදිරියට කරගෙන යාම අවශ්‍ය වේදැයි හැඟී යතොත් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවාලීමේ මට්ටමේ දී පිරිවැය ප්‍රතිලාභ ඇගයීමක් කරලීමෙන් අනතුරුව තව දුරටත් ක්‍රියා කිරීම සඳහා එකී අවශ්‍යතාව ජාතික ප්‍රසම්පාදන දෙපාර්තමේනතුවට මෙන්ම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ද වාර්තා කළ යුතුය. ව්‍යාපෘතිය හෝ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අවසරයක් දෙනු ලබන තෙක් හුදෙක් ශක්‍යතා

යොමු කළ යුතු වන අතර, අවශ්‍ය වියහැකි පරිදි රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා සහ වෙනත් ආයතන සමඟ සෘජුවම සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා විදේශ සම්බන්ධතා අමාත්‍යාංශය විසින් එහි නිලධාරයෙකු නම් කරනු ලබනවා ඇත.

1.2 වහාම බලපැවැත්වෙන පරිදි, මහජන ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජන යෝජනා, මූල්‍ය යෝජනා හෝ ද්විපාර්ශවීය හෝ බහුපාර්ශවීය වශයෙන් ප්‍රදානය කෙරෙන ආධාර, විදේශ ණය හෝ අරමුදල් සම්පාදනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන් වැළකී සිටීම මැනවි. මෙම වැඩ කටයුතු ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් වන්නේය.

1.3 මහජන කොන්ත්‍රාත්කරුවන් සහ කවර වුව මහජන ආයතනයක් සමඟ පොදු ගිවිසුම්වලට එළඹෙන පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා වන 1987 අංක 3 දරණ මහජන කොන්ත්‍රාත් පනත බලාත්මක කිරීම. තවද, ඕනෑම නියෝජිත අනුග්‍රාහකයකු විසින් ස්වකීය තොරතුරු, බදු විස්තර, අක්තපත්‍ර සහ ඔහුගේ සේවා ගාස්තුව සහ එම මුදල් ගෙවනු ලබන ආකාරය සහ කවුරුන් විසින්ද යන්න සම්පූර්ණයෙන් අනාවරණය කළ යුතුය.

1.4 දැනටමත් අත්සන් කරනු ලැබ ඇති අවබෝධතා ගිවිසුම් හා අත්සන් කිරීමට ඇති ගිවිසුම් පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් සම්පාදනය කර එය විදේශ සම්බන්ධතා අමාත්‍යාංශය වෙත යොමු කර ඒවා සකසා ගන්නේ කෙසේද යන්න පිළිබඳව නිසි මඟ පෙන්වීමක් හා උපදෙස් ලබා ගන්න. එවිට යම් ප්‍රමාදයන් ආදිය පිළිබඳව නිසි අයුරින් ක්‍රියා කරමින් වියිමත් ප්‍රවේශයකට අවතීර්ණ විය හැකිය.

1.5 අමාත්‍ය මණ්ඩල අනුමැතිය, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය හෝ එවැනි වෙනත් බලයලත් ආයතනයක් හෝ පුද්ගලයෙක්, අගය මත පදනම් වූ අනෙකුත් සැලකිය යුතු කරුණු, කොන්ත්‍රාත් සඳහා ණය ගිවිසුම්, අත්සන් කිරීමට යෝජිත ඇපකරුවන් ආදිය සඳහා ගරු නීතිපතිතුමන්ගේ අනුමැතිය, මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද අයවැය ප්‍රතිපාදන තිබේද යන වග, ප්‍රධාන ගණන් දීමේ නිලධරයා ලෙස අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා කඩිනමින් ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා පූර්ණ වශයෙන් දැනුවත්ව හා සෑහීමකට පත්ව සිටී ද යන්න බව සහතික කිරීම පිණිස කිසියම් ක්‍රියා පටිපාටික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරා ඇද්ද යන්න වැනි අවශ්‍ය සුදුසුකම් පරීක්ෂා කර බලන අතරතුර දැනටමත් සිදු කර ඇති හා වියිමත් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කිරීම.

2. **පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය** - මෙහි සඳහන් කර ඇති ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව ගරු නීතිපතිතුමන්ගෙන් පූර්ව අනුමැතිය සහ අවසන් වශයෙන් අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමකින් තොරව තව දුරටත් කිසිදු බැඳීමක් ඇති කරගැනීමෙන් හෝ අවබෝධතා ගිවිසුම් හෝ ගිවිසුම් වලට එළඹීමෙන් වැළකී සිටීම.

3. **ආයෝජන යෝජනා** - අනාගත ආයෝජකයින්ගේ සියලුම ආයෝජන යෝජනා, එබඳු යෝජනා සියල්ලක්ම භාර ගැනීමට කැපවීම සහිතව අධිකාරි බලය ලත් ආයෝජන මණ්ඩලය විසින් පිහිටුවනු ලබන "ඉදිරිපස කාර්යාලය" වෙත යොමු කරලීම. අනතුරුව "ඉදිරිපස කාර්යාලය" විසින් එකී යෝජනා සියල්ලම, පිරිසැකසීමේ වගකීම පැවරී ඇති "පසුපස කාර්යාලය" වෙත යොමු කෙරෙනු ඇත. ස්වාධීන ඇගයීමක් සිදුවීම සහතික කරගනු පිණිස ආයෝජකයින් පසුපස කාර්යාලය සමඟ සම්බන්ධ නොවන බවට ද ඉදිරිපස කාර්යාලය විසින් සහතික කර ගනු ඇත. නම් කරන ලද විද්වත් මණ්ඩලය විසින් අනාගත ආයෝජකයන්, යෝජිත මූල්‍යයන ප්‍රභවයන්, අතීත අත්දැකීම් සහ එබඳු ආයෝජනයන්හි නියැළීමෙන් අනාගත ආයෝජකයා අත්කරගත් සාර්ථකත්වය සැලකිල්ලට ගනිමින් යෝජිත ආයෝජනය සඵල වීමට ඇති අවකාශය පිළිබඳව නිසි උද්යෝගී පිරික්සුමක් කරනු ඇත. එකී විද්වත් මණ්ඩලය විසින් රජයේ යෝජිත ප්‍රතිපත්තිමය ආකෘතික රාමුව තුළ, රජය වෙතින් අපේක්ෂිත ඉඩම් සැපයීම, පාරිසරික නිෂ්කාශනයන්, නෛතික සහ නියාමන බැඳීම, ජාතික ආරක්ෂාවට අදාළ ව සැලකිලිමත් විය යුතු යම් කරුණු, අපේක්ෂිත බදු ආශ්‍රිත අනුග්‍රහයන්, රජයේ දෘෂ්ටී කෝණයෙන් බලන විට ආයෝජනයට සූදානම් සහිත බව ආදිය ද සැලකිල්ලට ගනිමින් යෝජනාව පිරික්සා බලනු ඇත. එකී ක්‍රියාවලිය නිමාවට පත් වූ විට ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙකී

පදනමින් කිසිදු බැඳීමකට නොඑළඹිය යුතු අතර එබඳු බැඳීම් වලට එළැඹීම හේතුවෙන් අනෙකුත් සංවර්ධන ප්‍රමුඛතා කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය හැකිය.

10. **ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය** - සියලුම රජයේ ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාළ වන්නාවූ ප්‍රශස්ථ ජාත්‍යන්තර භාවිතයන් පාදක කරගත් ඒකාබද්ධ ජාතික ප්‍රසම්පාදන පද්ධතියක් හඳුන්වා දීමේ අරමුණින්, ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රතිසංවිධානයෙන් කාර්යක්ෂම කරලමින් සුසංගත කිරීමට කටයුතු කෙරෙමින් ඇත. නව ව්‍යාපෘතීන්ට අදාළ කෙරෙන මාර්ගෝපදේශ සම්පාදනය කරලනු පිණිස කමිටුවක් නුදුරේදී ම පත් කරනු ලැබේ. නව පිළිවෙතකට සංක්‍රමණය වනු පිණිස දැනට පවත්නා කාර්යයන් කඩිනම් කරලමින් හැකි ඉක්මනින් නිමාවට පත් කරන මෙන් සියලුම ලේකම්වරුන් හට උපදෙස් දෙනු ලැබේ.

පාර්ලිමේන්තුව මගින් පළමු වාර්ෂික අයවැය අනුමත කරනු ලබන තෙක් 2020 ජනවාරි මස සිට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට රජය විසින් ක්‍රියා කරනු ලබන බැවින් දැනට කෙරෙමින් ඇති වැඩකටයුතු ඉදිරියට කරගෙන යාමට අමාත්‍යාංශයන්ට සහ වැය කිරීමේ ආයතනයන්ට අවසර දෙනු ලැබේ. මහ ජනතාව වෙත උපරිම සේවාවන් සපයාලීම පිණිස දැනට ක්‍රියාත්මක කාර්යයන් පිරිවැය ඵලදායි අයුරින් නිමාවට පත් කරලීම කෙරෙහි සියලුම අමාත්‍යාංශයන්හි සාමූහික ප්‍රයත්නය අවශ්‍යයෙන්ම යොමු විය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල විධායක කාර්තව්‍යයන් සපුරාලීම සහ අතිගරු ජනාධිපතිතුමන් වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පැවරී ඇති නායකත්ව කාර්යභාරය ගරු අග්‍රාමාත්‍යතුමන් සමඟ උපදෙස් සාකච්ඡා කොට ඉෂ්ට කරලීම පිණිස ජනාධිපති කාර්යාලය ප්‍රතිව්‍යුහගත කරනු ලැබ ඇත. ජනාධිපති කාර්යාලයෙහි නව සංවිධානික ආකෘතික රාමුව තුළින් රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ටත්, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්ට මෙන්ම දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රධානීන් හට අවශ්‍ය කිසියම් සහයක් සඳහා ජනාධිපති අතිරේක ලේකම්වරුන් විමසීමට සෘජුව අවකාශ සලසනු ලැබ ඇත.

මෙම චක්‍රලේඛය හෝ සංවිධානික විධිවිධාන පිළිබඳව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙතොත් අතිරේක ලේකම් (රජයේ කටයුතු) - චන්දිමා වික්‍රමසිංහ මෙනවිය වෙතින් ලබා ගත හැකිය.

**පී බී ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත්:
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. විගණකාධිපති
4. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති
5. සභාපති, ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය